# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2325/75 - 2023 අප්‍රේල් මස 01 වැනි සෙනසුරාදා - 2023.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ශුද්ධි පත්‍රිකාවයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ වූ දැන්වීමේ සංශෝධනය**

**පරකන්දෙණිය උතුර සේවා පියස ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම**

*ප්‍රා. ලේ. යොමු අංකය* : ජීඑම්/ඩීඑස්/එච්ඩබ්/2015/2/2/1/133.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/8/2016/එච්ජ්/218.

උක්ත කරුණට අදාළව 2019 ජනවාරි මස 22 දිනැති 2107/20 අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ 07 වන වගන්තිය යටතේ පළ කරන ලද දැන්වීම කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

එහි සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ පහත සඳහන් දිනයන්හි දී පෙරවරු 10.00 ට ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

පරීක්ෂණ දිනය:

| කැබලි අංක | දිනය |
|---|---|
| 01 | 2023.04.28 |

තව ද, 2023 අප්‍රේල් මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

කේ.ඒ.එස්.එල්. ගුණතිලක,
ප්‍රාදේශීය ලේකම්,
ගම්පහ.

2023 මාර්තු මස 29 වැනි දින,
ගම්පහ,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 04 - 0004

1A - G 039260 - 09 (2023/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රා. ලේ. යොමු අංකය* : බීඩී/කේකේ/එල්එන්ඩී2/9/8.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2016/ඩබ්එස්/312.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 31බී, කන්දකැටිය ග්‍රාම නිළධාරී වසමේ කිවුලේගෙදර ගමේ මැනුම්පති විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 710129 හි කලාප අංක 01 හි පත්‍ර අංක 03 හි කැබලි අංක 142, 144, 145 දක්වා දැක්වෙන ඉඩම් අතරින් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1012 ක් වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබලි තුනක් (03):

01. **කැබලි අංක 142**

ඉඩමේ නම: කන්දකැටියහේන; ඉඩමේ විස්තරය: වත්ත, අවු. 20-25 පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නා: රජය; නැසීගිය රාජපක්ෂ දේවයලාගේ ලැයිසා විසින් භුක්ති විඳින ලද; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0330.

*උතුරට* : කැබලි අංක 141 සහ 143; *නැගෙනහිරට*: කැබලි අංක 141 සහ 143; *දකුණට*: කැබලි අංක 144, 145 සහ 146; *බටහිරට* : කැබලි අංක 53 සහ 141

02. **කැබලි අංක 144**

ඉඩමේ නම: කන්දකැටියහේන; ඉඩමේ විස්තරය: වත්ත, අවු. 20-25 පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නා: රජය; කන්දකැටිය, ට්‍රැක් 2/16 බාරේ පදිංචි කෝණාර මුදියන්සේලාගේ චන්ද්‍රානි බණ්ඩාර විසින් භුක්ති විඳී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0005.

*උතුරට* : කැබලි අංක 143; *නැගෙනහිරට*: කැබලි අංක 143 සහ හු.මු.පි. 47 හි කැබලි අංක 2300; *දකුණට*: හු.මු.පි. 47 හි කැබලි අංක 2300 සහ කැබලි අංක 145; *බටහිරට* : කැබලි අංක 145, 142, 141 සහ 143.

03. **කැබලි අංක 145**

ඉඩමේ නම: කන්දකැටියහේන; ඉඩමේ විස්තරය: වත්ත, අවු. 20-25 පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නා: රජය; කන්දකැටිය, පූස්සකන්ද ට්‍රැක් 02 හි පදිංචි දිසානායක මුදියන්සේලාගේ වීරසූරිය බණ්ඩා විසින් භුක්ති විඳී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0677.

*උතුරට* : කැබලි අංක 141, 142 සහ 143; *නැගෙනහිරට*: කැබලි අංක 143, 144 සහ හු.මු.පි. 47 හි කැබලි අංක 2300; *දකුණට*: හු.මු.පි. 47 හි කැබලි අංක 2300 සහ කැබලි අංක 146; *බටහිරට* : කැබලි අංක 146, 53, 141 සහ 142.

ඉහත සඳහන් ඉඩම්/ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2023 මැයි මස 10 වැනි දින පෙරවරු 9.30ට කන්දකැටිය ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023.04.25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයේ මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩී.එම්.යූ.අයි.එන්.කේ.දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
කන්දකැටිය.

කන්දකැටිය.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 04 - 0005